සියලුම හිමිකම් ඇවිරිණි/ KOg; gjpg;GupikAilaJ / All Rights reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Department of Education Central Province

11 ශ්‍රේණිය | අ.පො.ස (සාමාන්‍ය පෙළ) පෙරහුරු පරීක්ෂණය - 2018 | 11 S I

# බුද්ධ ධර්මය I

**කාලය පැය තුනයි**

උපදෙස් :

- ප්‍රශ්න සියල්ලට පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.

01. "හේතුවෙන් උපදින යම් ධර්ම තාවයක් වෙත් ද ඒ ධර්මයන්ගේ හේතුව තථාගතයන් වහන්සේ වදාළ සේක. ඒ ධර්මයන්ගේ යම් නිරෝධයක් වේද එය ද දේශනා කළ සේක" මෙම අර්ථය සඳහන් ගාථාවේ මුල් දෙපදය වන්නේ,
1. "අනේකජාතී සංසාරං - සන්ධාවිස්සං අනිබ්බිසං" යන්නයි.
2. "හේතුං පටිච්ච සම්භූතං - හේතු භංගා නිරුජ්ඣති" යන්නයි.
3. "ඉමස්මිං සති ඉදං හෝති - ඉමස්ස උප්පාදා ඉදං උපපජ්ජති" යන්නයි.
4. "යේ ධම්මා හේතුප්පභවා - තේසං හේතුං තථාගතෝ ආහ" යන්නයි.

02. පිප්ඵලී ගුහාවට වැඩමවා සත්ත බොජ්ඣංගය දේශනා කරමින් බුදුරජාණන් වහන්සේ විසින් සුවපත්භාවයට පත් කළේ
1. මුගලන් මහරහතන් වහන්සේ ය.
2. සැරියුත් මහරහතන් වහන්සේ ය.
3. මහා කාශ්‍යප මහරහතන් වහන්සේ ය.
4. උපාලි මහරහතන් වහන්සේ ය.

03. බුදුරජාණන් වහන්සේ හා වාදයට පැමිණ "සූර්යාලෝකය හමුවේ කණාමැදිරි එළිය වියැකී යන්නා සේ" පරාජයට පත් වූයේ,
1. නිගණ්ඨනාථ පුත්ත ය.
2. සච්චක නිගණ්ඨයා ය.
3. පොට්ඨපාද පිරිවැජියා ය.
4. සෝණදණ්ඩ බ්‍රාහ්මණයාය.

04. මහා කරුණා සමාපත්තියට සමවැදි බුදුරජාණන් වහන්සේ පිහිටවිය යුත්තන් කවුරුන්දැයි විමසා බැලුයේ,
1. මැදියම් කිසේදි ය.
2. පෙරයම් කිසේදි ය.
3. පැසුලුයම් කිසේදි ය.
4. පසුබත් කිසේදි ය.

05. අක්කෝස භාරද්වාජ, මාගන්දියා වැනි අයගේ අපහාස හමුවේ නොසැලී කටයුතු කිරීමෙන් බුදුරජාණන් වහන්සේ තුළ පැවති,
1. තාදී ගුණය ප්‍රකට වේ.
2. අසරණ සරණ ගුණය ප්‍රකට වේ.
3. පුරිසදම්ම සාරථී ගුණය ප්‍රකට වේ.
4. මහා කරුණා ගුණය ප්‍රකට වේ.

06. සත්‍යය සොයා ගිය සිද්ධාර්ථ බෝසතාණන් වහන්සේ බුද්ධත්වය සඳහා විදර්ශනා වැඩීමට තෝරාගත් සුන්දර පරිසරය වූයේ,
1. කොසොල් ජනපදයේ චම්පා නුවරයි.
2. උරුවෙල් ජනපදයේ සේනානි ගම් පියසයි.
3. ශාක්‍ය ජනපදයේ රෝහිණී නදී තීරයයි.
4. මගධ රාජ්‍යයේ යමුනා නදී තීරයයි.

07. සමථ භාවනාවේදී පංච නීවරණයන් යටපත් කරනු ලබයි. ඒ අනුව විචිකිච්ඡා නීවරණය සාමඤ්ඤඵල සූත්‍රයේදී උපමා කර ඇත්තේ,
1. වනයක අතරමං වුවෙකු ලෙසය.
2. ආහාරයක කිසිදු රසයක් නොදැනෙන්නා ලෙසය.
3. සිර ගෙයක දුක් විඳින්නකු ලෙසය.
4. ණය ගැතියකු ණය හිමිට ඇති බැඳීමක් ලෙසය.

08. අතිගරු රේරුකානේ මහ නාහිමියන් විසින් රචනා කරන ලද සමාජයේ බොහෝ දෙනා අතර ඇති ප්‍රශ්න සියයකට පිළිතුරු සැපයෙන ග්‍රන්ථය වනුයේ,
1. පොහොය දිනයයි.
2. බෞද්ධයාගේ අත්පොතයි.
3. ධර්ම විනිශ්චයයි.
4. අභිධර්ම මාර්ගයයි.

09. "භාවනානුයෝගී යෝගාවචරයාගේ සිත කුසල් අරමුණෙහි පිහිටා භාවනා වැඩිය යුතුය" සිත කුසල් අරමුණින් බැහැර කරවීමට බලපාන ප්‍රබල හේතුව වන්නේ,
1. පංච නියාම ධර්මයයි.
2. පංචස්කන්ධයයි.
3. පංච මහා විලෝකනයයි.
4. පංච නීවරණයයි.

10. ලොව පවතින යථා ස්වභාවය පැහැදිලි කරන හේතුඵල දහමේ පටිලෝම දේශනාව අනුව අවිද්‍යාව නැතිවන විට හා විඤ්ඤාණය නැතිවන විට,
1. සංස්කාර හා නාමරූප නැතිවේ. 2. සංස්කාර හා විඤ්ඤාණය නැතිවේ.
3. සළායතන හා ස්පර්ශය නැතිවේ. 4. ස්පර්ශය හා වේදනාව නැතිවේ.

11. අප බෝසතාණන් වහන්සේ මෛත්‍රී පාරමිතාව ප්‍රගුණ කළ ආකාරය හෙළිවන ජාතක කථාවක් වනුයේ,
1. ලෝමහංස ජාතකයයි. 2. මහා කපි ජාතකයයි.
3. වට්ටක ජාතකයයි. 4. තේමිය ජාතකයයි.

12. මුළු ජීවිතයම පරිත්‍යාග කරමින් දස පෙරුම්දම් පිරීම හඳුන්වන්නේ,
1. පාරමී ලෙසය. 2. උපපාරමී ලෙසය. 3. පරමත්ථ පාරමී ලෙසය. 4. දස පාරමී ලෙසය.

13. ආහාරයෙහි ප්‍රමාණය දැන අනුභව කිරීම නිසා යහපත් ප්‍රතිඵල ලැබෙන බව භද්දාලි සූත්‍රයෙහි දක්වා ඇත. එයට අදාල කරුණක් නොවන්නේ,
1. සැහැල්ලු පැවැත්මය. 2. සුවපහසු පැවැත්මය. 3. රෝගාබාධ අඩු බවය. 4. දුක් සහිත බවය.

14. සැම කල්හිම සිහි ඇතිව පමණ දැන ආහාර ගන්නා තැනැත්තාගේ දුක් තුනීවන බව බුදුරජාණන් වහන්සේ දේශනා කළේ,
1. බිම්බිසාර රජතුමාට ය. 2. කොසොල් රජතුමාට ය. 3. සුද්ධෝදන රජතුමාට ය. 4. උදේනි රජතුමාට ය.

15. ධම්මපදයට අයත් ගාථා හා නිදාන කතා ගණන වනුයේ,
1. ගාථා 423 හා නිදාන කතා 295 කි. 2. ගාථා 432 හා නිදාන කතා 299 කි.
3. ගාථා 423 හා නිදාන කතා 299 කි. 4. ගාථා 432 හා නිදාන කතා 295 කි.

16. තමා පව් කළහොත් තමා අපිරිසිදු වේ. මේ අදහස් දැක්වෙන ධම්මපද ගාථාව නම්,
1. සුකරානි අසාධූනි ..... යන්නයි. 2. නතං කම්මං කතං සාධු .... යන්නයි.
3. අත්තනා ව කතං පාපං .... යන්නයි. 4. අක්කොච්ඡි මං අවධිමං .... යන්නයි.

17. "අ" කොටසට ගැළපෙන පිළිතුරු "ආ" කොටසින් තෝරා නිවැරදි පිළිතුර තෝරන්න.

| "අ" | | "ආ" |
|---|---|---|
| 1. වස් විසූ ස්ථානයකි | (    ) | A. නිග්‍රෝධ උයන |
| 2. දම් සභා මණ්ඩපයකි | (    ) | B. ගෝතමක චෛත්‍යය |
| 3. වර්ණනාවට ලක්වූ ස්ථානයකි | (    ) | C. අනුපිය අඹ වනය |
| 4. නේවාසික ස්ථානයකි | (    ) | D. චාලිය පර්වතය |
| 5. විවේකීව විසූ ස්ථානයයි | (    ) | E. සූකරකත ලෙන |

1. DBACE 2. DEBAC 3. BADCE 4. ACEDB

18. පංච උපාදාන ස්කන්ධයේ ඇති අනිත්‍ය, දුක්ඛ, අනාත්ම ස්වභාවය ගැඹුරින් වටහාගෙන ප්‍රඥාව වැඩිදියුණු කිරීම සිදුකරනු ලබන්නේ,
1. විදර්ශනා භාවනාවෙනි. 2. සමථ භාවනාවෙනි.
3. ධ්‍යාන භාවනාවෙනි. 4. චිත්ත භාවනාවෙනි.

19. ගරු කළ යුත්තන්ට ගරු නොකරන, පිදිය යුත්තන් නොපුදන, අධික මානයෙන් යුත් තැනැත්තා,
1. පහත් යැයි සම්මත කුලවල උපදී. 2. මහා භෝගීව උපදී.
3. අල්පේවජව උපදී. 4. ප්‍රඥාව අඩුව උපදී.

20. ස්ථානෝචිත ප්‍රඥාවෙන් හා උත්සාහයෙන් කටයුතු කිරීමේදී තමාට මුහුණ දීමට සිදුවන අකුසල කර්ම විපාක ද මගහරවා ගත හැකිය. එය හඳුන්වන්නේ,
1. ගති සම්පත්ති ලෙසය. 2. උපධි සම්පත්ති ලෙසය.
3. කාල සම්පත්ති ලෙසය. 4. ප්‍රයෝග සම්පත්ති ලෙසය.

21. කණිෂ්ක රජු දායකත්වයදුන් ධර්ම සංගායනාවේදී සිදුවූ වැදගත් සිදුවීමක් වන්නේ,
1. යුරෝපා රටවලට ධර්ම ප්‍රචාරය කිරීමය. 2. සියලු නිකායික මත එකමතයකට ගැනීමය.
3. පාලි ත්‍රිපිටකය ඉංග්‍රීසියට පරිවර්තනය කිරීමය. 4. නිකාය භේදය ඇතිවීමය.

22. තෙවන ධර්ම සංගායනාවේ ප්‍රතිඵලයක් ලෙස ථෙරවාදී බුදුදහම දේශ දේශාන්තර වල ව්‍යාප්ත විය. එයින් බ්‍රහ්මජාල සූත්‍රය දේශනා කළේ,
1. මහිස මණ්ඩලයේදී ය. 2. හිමවන්ත ප්‍රදේශයේදී ය.
3. අපරන්ත දේශයේදී ය. 4. ස්වර්ණභූමියේදී ය.

23. මිහිඳු මහරහතන් වහන්සේ ලක්දිවට වැඩම කළැයි සලකනු ලබන්නේ ධර්මාශෝක අධිරාජයාගේ,
1. දහ අට වැනි රාජ්‍ය වර්ෂයේ ය.
2. දහ නව වැනි රාජ්‍ය වර්ෂයේ ය.
3. විසි එක් වැනි රාජ්‍ය වර්ෂයේ ය.
4. විසි වැනි රාජ්‍ය වර්ෂයේ ය.

24. දීඝජානු කෝලිය පුත්‍රයාට දේශනා කළ මෙලොව දියුණුවට හේතු වන කරුණු සතර අතරින් දැහැමි රැකියා අංශ හයක් පිළිබඳව පෙන්වා දී ඇත්තේ,
1. උට්ඨාන සම්පදාවේ දීය.
2. ආරක්ෂ සම්පදාවේ දීය.
3. කල්‍යාණ මිත්තතාවේ දීය.
4. සමජීවිකතාවේදීය.

25. හතරවන ථේරවාදී ධර්ම සංගායනාවට අනුග්‍රහය දැක්වූ රජතුමා වූයේ,
1 අජාසත්ත රජතුමා ය.
2. කණිෂ්ක රජතුමා ය.
3. වළගම්බා යුගයේ ප්‍රදේශීය පාලයෙකු.
4. දෙවනපෑතිස් රජතුමා ය.

26. මහා සංඝරත්නය මනා වූ පිළිවෙත් පුරන නිසා,
1. ඤායපටිපන්න නම් වන සේක.
2. සුපටිපන්න නම් වන සේක.
3. උජුපටිපන්න නම් වන සේක.
4. සාමීචිපටිපන්න නම් වේ.

27. දඹදෙණි යුගයට අයත් සද්ධර්මරත්නාවලිය හා පූජාවලිය යන අගනා ග්‍රන්ථ රචනා කළ කතුවරුන් අනුපිළිවෙලින් වන්නේ,
1. වෑත්තෑවේ හිමි හා ධර්මසේන හිමියන්ය.
2. ධර්මසේන හිමි හා බුද්ධපුත්‍ර හිමියන්ය.
3. බුද්ධපුත්‍ර හිමි හා වෑත්තෑවේ හිමියන්ය.
4. බුද්ධපුත්‍ර හිමි හා ධර්මසේන හිමියන්ය.

28. පාලි බෝධිවංශය පදනම් කරගෙන රචනා වූ ග්‍රන්ථයක් වනුයේ,
1. සද්ධර්මරත්නාවලිය යි.
2. පූජාවලිය යි.
3. බුත්සරණය යි.
4. ධර්ම ප්‍රදීපිකාව යි.

29. පොලොන්නරු යුගයේ පැරණිම සිතුවම් පැවති ස්ථාන වලට අයත් නොවනුයේ,
1. සීගිරියයි.
2. මහියංගණයයි.
3. දිඹුලාගලයි.
4. තිවංක පිළිමගෙයයි.

30. කිසියම් රාජ්‍යයක යහපාලනයක් පවත්වාගෙන යාමට උපකාරී වන රාජ්‍ය පාලන ප්‍රතිපත්ති රැසක් බුදු දහමේ හමුවේ. දස සක්විතිවත් ඒ අතර වැදගත් තැනක් ගනී. එම පිළිවෙත් සඳහන් වන සූත්‍රය වනුයේ,
1. අග්ගඤ්ඤ සූත්‍රයයි.
2. මධුර සූත්‍රයයි.
3. චක්කවත්තිසීහනාද සූත්‍රයයි.
4. කූටදන්ත සූත්‍රයයි.

31. පාලකයා රටවැසියාගේ යහපත සඳහා තම කාලය, ශ්‍රමය, ධනය, සුව, පහසුව යනාදිය කැප කළ යුතුය. එම කැප කිරීම දසරාජධර්ම වල හඳුන්වන්නේ,
1. දානය ලෙසයි.
2. ශීලය ලෙසයි.
3. පරිත්‍යාගය ලෙසයි.
4. ඍජු බව ලෙසයි.

32. ලක්දිව පරම විඥානාර්ථ නම් බෞද්ධ සමාගම පිහිටුවීමට පුරෝගාමිත්වය දැක්වූයේ,
1. අනගාරික ධර්මපාලතුමා ය.
2. හෙන්රි ස්ටීල් ඕල්කට් තුමා ය.
3. මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි ය.
4. බ්ලැවට්ස්කි මැතිණිය ය.

33. සෙනරත් පරණවිතාන මහතාගේ අදහසට අනුව සඳකඩපහණේ සත්වාවලියෙන් නිරූපණය වන්නේ,
1. සතර සංග්‍රහවස්තුය.
2. සතර මහෝපදේශයන්ය.
3. සතර මහා භූතයන්ය.
4. සතර භයය.

34. පරපණ නැසීම, සොරකම් කිරීම, වැරදි කාම සේවනය යන අකුසල් තුනෙන් වැළකී සිටීම.
1. සම්මා දිට්ඨියයි.
2. සම්මා කම්මන්තයයි.
3. සම්මා ආජීවයයි.
4. සම්මා වායාමයයි.

35. චතුරාර්ය සත්‍යයේ දුක්ඛ යන්න හැඳින්වීමට බුද්ධ වචනයේ ගැඹුරු වචන කිහිපයක් භාවිතා කොට ඇත. එසේ භාවිතා නොකරන වචනය වන්නේ,
1. අතෘප්තිකර බවයි.
2. අර්ථශූන්‍ය බවයි.
3. අසන්තෝෂ බවයි.
4. තුච්ඡ බවයි.

36. පත්තකම්ම සූත්‍රයේ සඳහන් පරිදි ප්‍රාප්ති කර්ම ඉටුකිරීමේදී පුබ්බප්‍රේතබලිය ඉටුකළයුතු බව දක්වා ඇත. මින් අදහස් වන්නේ,
1. මියගිය ඥාතීන්ට යුතුකම් ඉටුකිරීමයි.
2. දෙවියන්ට පින්දීමයි.
3. ආගන්තුක සත්කාරයයි.
4. ඥාතීන්ට සැලකීමයි.

37. තණ්හාව මුල්කොටගෙන සමාජයේ කලකෝලාහල ඇතිවන අයුරු පටිච්ච සමුප්පාදයට අනුව පෙන්වා දී ඇත්තේ,
1. මහා නිදාන සූත්‍රයේය.
2. චක්කවත්ති සීහනාද සූත්‍රයේය.
3. අග්ගිවච්චගොත්ත සූත්‍රයේය.
4. චූල්ලකම්මවිභංග සූත්‍රයේය.

38. නූතන චිත්‍ර කලා විෂයෙහි දේශීය හා විදේශීය ශෛලීන්ගේ ලක්ෂණ උකහාගෙන කැලණි විහාර මන්දිරයේ සිතුවම් නිර්මාණය කර ඇත්තේ,
1. සෝමබන්දු විද්‍යාපති මහතා විසින් ය.
2. ඇල්බට් ධර්මසිරි මහතා විසින් ය.
3. ජෝර්ජ් කීට් මහතා විසින් ය.
4. සෝලියස් මෙන්ඩිස් මහතා විසින් ය.

39. මානව අයිතිවාසිකම් ආරක්ෂා කර ගැනීමට බෞද්ධයා තුළ තිබිය යුතු මූලික පියවර වනුයේ,
1. තෙරුවන් සරණයාමයි.
2. දන් දීමයි.
3. පන්සිල් රැකීමයි.
4. සිල් රැකීමය.

40. පහත රූප සටහනේ දැක්වෙන්නේ බුද්ධ ප්‍රතිමා කලාවේ දැක්වෙන ආසන ක්‍රමයකි. එය හඳුන්වන්නේ,



1. භද්‍රාසනය නමිනි.
2. වීරාසනය නමිනි.
3. පද්මාසනය නමිනි.
4. වජ්‍රාසනය නමිනි.

(ලකුණු 1x40 )

* * * * *

සියලුම හිමිකම් ඇවිරිණි/ KOg; gjpg;GupikAilaJ / All Rights reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Department of Education Central Province

11 ශ්‍රේණිය | අ.පො.ස (සාමාන්‍ය පෙළ) පෙරහුරු පරීක්ෂණය - 2018 | 11 S II

# බුද්ධ ධර්මය II

උපදෙස් :

- පළමුවන ප්‍රශ්නය හා තෝරාගත් තවත් ප්‍රශ්න හතකට පිළිතුරු සපයන්න. පළමු ප්‍රශ්නයට ලකුණු 20 ක්ද, 02 වන ප්‍රශ්නයේ සිට 06 වන ප්‍රශ්නය දක්වා **(i)** කොටසට ලකුණු 2 ක්ද, **(ii)** කොටසට ලකුණු 3ක්ද, **(iii)** කොටසට ලකුණු 5 ක් ද හිමි.
- හත්වන ප්‍රශ්නයට ලකුණු 5 බැගින් හිමි වේ.

01. කෙටි පිළිතුරු සපයන්න.
   (i) රාහුලෝ ජාතෝ බන්ධනං ජාතං .... යන පාඨයේ අර්ථය ලියන්න.
   (ii) ශ්‍රද්ධාවේ මූලික ප්‍රභේද දෙක නම් කරන්න.
   (ii) බුදුරජාණන් වහන්සේ දහවන හා දොළොස්වන වස්කාලයන් වැඩ සිටි ස්ථාන නම් කරන්න.
   (iv) සමථ භාවනාවෙන් ලබාගත හැකි උසස්තම ඵල දෙක නම් කරන්න.
   (v) සම්මා දිට්ඨිය පස් ආකාරයකි. එයින් දෙකක් නම් කරන්න.
   (vi) "ජිගච්ඡා පරමා රෝගා" යන්නෙහි අර්ථය ලියන්න.
   (vii) කෘත්‍ය හෙවත් කාර්යයන් අනුව කර්මය සතරාකාර වේ. එයින් දෙකක් නම් කරන්න.
   (viii) සීලයේ ආනිසංස අතරින් දෙකක් ලියන්න.
   (xi) බුද්ධ දේශනාවේ සඳහන් පරිදි ස්තූපයකින් උපහාර ලද හැකි (ථූපහාර්ය) උතුමන් දෙදෙනෙක් නම් කරන්න.
   (x) බුදු දහමට අනුව සත්වයා නිර්මාණය වී ඇත්තේ නාම රූප තුළනි. ඒ අනුව රූපස්කන්ධය හා සංඛාරස්කන්ධය සඳහා දක්වා ඇති උපමාවන් නම් කරන්න.

02. (i) සිදුහත් බෝසතාණන් වහන්සේ මුහුණ දුන් අභියෝග දෙකක් ලියන්න.
   (ii) ඉන් එක් අභියෝගයක් කෙටියෙන් දක්වන්න.
   (iii) ඔබේ ජීවිතය සාර්ථක කර ගැනීමට බුද්ධ චරිතයේ මානුෂීය ගති ලක්ෂණ යොදාගත හැකි ආකාරය විවරණය කරන්න.

03. (i) බෞද්ධ භාවනාවේ ප්‍රධාන ප්‍රභේද දෙක නම් කරන්න.
   (ii) ඉන් එක් ප්‍රභේදයක් කෙටියෙන් පැහැදිලි කරන්න.
   (iii) ශිෂ්‍ය ජීවිතය සාර්ථක කර ගැනීම සඳහා භාවනාව යොදා ගත හැකි ආකාරය විස්තර කරන්න.

04. (i) "තංච කම්මං කතං සාධු ... " යන ධම්මපද ගාථාව සම්පූර්ණ කරන්න.
   (ii) එහි අදහස කෙටියෙන් ලියා දක්වන්න.
   (iii) සමාජ අභියෝග හමුවේ නොසැලී කටයුතු කිරීමට ධම්මපදය යොදාගත හැකි ආකාරය විවරණය කරන්න.

05. (i) "හේතුං පටිච්ච සම්භූතං - හේතු භංගා නිරුජ්ඣති .... " මෙහි තේරුම ලියන්න.
   (ii) පටිච්ච සමුප්පාද කෙටි සූත්‍රය ලියා දක්වන්න.
   (iii) පටිච්ච සමුප්පාදය සමාජ ගැටලු විසදා ගැනීම සඳහා යොදාගත හැකි ආකාරය විස්තර කරන්න.

06. (i) බෞද්ධ රාජ්‍ය පාලන ප්‍රතිපත්ති දෙකක් ලියන්න.
   (ii) ඉන් එක් රාජ්‍ය පාලන ප්‍රතිපත්තියක් කෙටියෙන් පැහැදිලි කරන්න.
   (iii) බෞද්ධ රාජ්‍ය පාලන ප්‍රතිපත්ති නූතන රාජ්‍ය පාලනයේ දී යොදාගත හැකි ආකාරය පැහැදිලි කරන්න.

07. පහත සඳහන් මාතෘකා අතරින් දෙකකට කෙටි සටහන් ලියන්න.
   (i) දුටුගැමුණු රජතුමා
   (ii) මහින්දාගමනය
   (iii) දුක්ඛ සමුදය ආර්ය සත්‍යය
   (vi) බුදු පිළිමවල දැකිය හැකි මුද්‍රා.

**මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**බුද්ධ ධර්මය - 11 ශ්‍රේණිය**
**පිළිතුරු පත්‍රය - I පත්‍රය**

| | | | |
|---|---|---|---|
| 01. 4 | 11. 2 | 21. 2 | 31. 3 |
| 02. 3 | 12. 3 | 22. 4 | 32. 2 |
| 03. 2 | 13. 4 | 23. 1 | 33. 4 |
| 04. 2 | 14. 2 | 24. 1 | 34. 2 |
| 05. 1 | 15. 3 | 25. 3 | 35. 3 |
| 06. 2 | 16. 3 | 26. 2 | 36. 1 |
| 07. 1 | 17. 2 | 27. 2 | 37. 1 |
| 08. 3 | 18. 1 | 28. 4 | 38. 4 |
| 09. 4 | 19. 1 | 29. 1 | 39. 2 |
| 10. 2 | 20. 4 | 30. 3 | 40. 2 |

**II පත්‍රය**

01. 1. රාහුලයෙක් උපන්නා, බන්ධනයක් ඇති විය.
2. අමූලිකා ශ්‍රද්ධා හා ආකාරවතී ශ්‍රද්ධා
3. දහවන වස් කාලය - පාරිලෙය්‍ය වනය
දොළොස්වන වස් කාලය - වේරංජා නුවර
4. පංච අභිඥා, අෂ්ට සමාපත්ති
5. කම්මස්සකතා සම්මා දිට්ඨිය, ධ්‍යාන සම්මා දිට්ඨිය, විදර්ශනා සම්මා දිට්ඨිය, මාර්ග සම්මා දිට්ඨිය, ඵල සම්මා දිට්ඨිය
6. කුසගින්න ලොව පවත්නා බලවත්ම රෝගයයි.
7. ජනක කර්මය, උපත්ථම්භක කර්මය, උපපීඩක කර්ම, උපඝාතක කර්ම
8. මහත් වූ භෝග සම්පත් අත්කර ගැනීම, කීර්තිය පැතිරීම, ඕනෑම පිරිසක් මැදට නිර්භය ව එළඹීමට හැකිවීම, සිහිමුලා නොවී කලුරිය කිරීම, මරණින් මතු සුගතියෙහි උපත ලැබීම.
9. බුදු, පසේබුදු, මහරහත්, සක්විති රජ
10. රූපස්කන්ධය - පෙණ පිඩක් වැනිය
සංඛාරස්කන්ධය - කෙසෙල් කඳක් වැනිය (ලකුණු 2x10 =20)

02. 1. උපත, ශිල්ප හැදෑරීම, සතර පෙරනිමිති දැකීම, නිබ්බුත පද ඇසීම, පස්කම් සුව අත් හැරීම, පිය රජුගේ අපේක්ෂාවන් ඉටු කිරීම, සය වසරක දුෂ්කර ජීවිතය, විවාහ වීම. (ලකුණු 02යි)
2. ඉහත නම් කරන ලද අභියෝග වලින් එකක් පිළිබඳ කෙටි හැඳින්වීමක් අවශ්‍ය වේ. (ලකුණු 03යි)
3. ගිලනුන්ට උපස්ථාන කිරීම, අසරණ සරණ ගුණය, පුරිසදම්ම සාරථී ගුණය, තාදි ගුණය ආදී කරුණු මඟින් ජීවිතය සාර්ථක කරගත හැකි අන්දම උදාහරණ මඟින් පැහැදිලි කොට ඇත්නම් පිළිතුර දෙස බලා අදාළ ලකුණු පිරිනමන්න.
(11 ශ්‍රේණිය 7 - 15 පිටු) (ලකුණු 05යි)

03. 1. සමථ භාවනාව හා විදර්ශන භාවනාව (ලකුණු 02යි)
2. සමථය යන්නෙහි තේරුම ලිවිය යුතුයි. සමාධි භාවනාව සඳහා යොමුවීමේදී තිබිය යුතු ගුණාංග, චරිත වලට අනුව කර්මස්ථාන තෝරා ගැනීම, භාවනාවට පිවිසෙන තැනැත්තාගේ පූර්ව අවශ්‍යතා, සමථ භාවනාවේ ප්‍රයෝජන ලියා තිබිය යුතුයි.
විදර්ශනා යන්නෙහි තේරුම ලිවිය යුතුයි. විපස්සනා භාවනාව හඳුන්වන වෙනත් නම්, විදර්ශනා භාවනාවේ ආනිසංස ලිවිය යුතුයි.
මෙම කරුණු වලට අනුව පිළිතුර ගොඩනගා ඇත්නම් අදාළ ලකුණු පිරිනමන්න.
(10 ශ්‍රේණිය 22 - 24 පිටු / 11 ශ්‍රේණිය 34 - 39 පිටු) (ලකුණු 02යි)
3. මතක ශක්තිය දියුණු වීම, එක අරමුණක සිටීමට හැකිවීම, ගැටලු විසඳීමේ ශක්තිය දියුණු වීම, වහා අවබෝධ කර ගැනීමේ ශක්තිය දියුණු වීම, ඉවසීමේ ශක්තිය දියුණු විම, පිළිවෙළින් යමක් ඉදිරිපත් කිරීමට හැකිවීම යන මෙම කරුණු වලට අනුව විස්තර කර තිබීම ප්‍රමාණවත්ය (ලකුණු 05යි)

04. 1. තංච කම්මං කතං සාධු
යං කත්වා නානුතප්පති
යස්ස පතීතෝ සුමනෝ
විපාකං පටිසේවතතී (ලකුණු 02යි)

2. යමක් කිරීමෙන් පසුතැවෙන්නට සිදු නොවේද යමක විපාකය ප්‍රීතියෙන් හා සොම්නසින් යුතුව විඳිය හැකි වේද. එබඳු ක්‍රියාවල නිරත විය යුතුය. (ලකුණු 03යි)

3. සමාජ අභියෝග හමුවේ නොසැලී කටයුතු කිරීමට ධම්ම පදයෙන් ලද හැකි උපදෙස් ඔස්සේ ගාථා 03 වත් උපයෝගි කොට ගෙන පිළිතුර ගොඩ නගා ඇත්නම් පිළිතුර දෙස බලා අදාළ ලකුණු පිරිනමන්න. (ලකුණු 05යි)

05. 1. හේතු නිසා ඇතිවන සියල්ලම නැතිවන ස්වභාවයෙන් ද යුක්තය, හේතු නැතිවන විට ඒ හේතු නිසා හටගත් දෙයද නැතිව යයි. (ලකුණු 02යි)

2. ඉමස්මිං සති ඉදං හෝති
ඉමස්ස උප්පාදා ඉදං උප්පජ්ජති
ඉමස්මිං අසති ඉදං න හෝති
ඉමස්ස නිරෝධා ඉදං නිරුජ්ඣති. (ලකුණු 03යි)

3. සමාජයේ පවතින ගැටලු පටිච්ච සමුප්පාද විග්‍රහයට අනුව විසඳා ගන්නා ආකාරය උදාහරණ සහිතව පැහැදිලි කර ඇත්නම් පිළිතුර දෙස බලා ලකුණු පිරිනමන්න. (ලකුණු 05යි)

06. 1. දස සක්විතිවත්, දස රාජධර්ම, සප්ත අපරිහානීය ධර්ම, සතර අගතියෙන් තොරවීම, සතර සංග්‍රහවස්තු පංචශීල ප්‍රතිපදාව සිව් බඹ විහරණ.
(මේවායින් කරුණු දෙකක් ලියා තිබිය යුතුය) (ලකුණු 02යි)

2. ඉහත නම් කරන ලද රාජ්‍ය පාලන ප්‍රතිපත්ති වලින් එකක් කෙටියෙන් විස්තර කළ යුතුය.
(10 ශ්‍රේණිය 124 - 129 / 11 ශ්‍රේණිය 156 - 161 පිටු) (ලකුණු 03යි)

3. ඉහත නම් කරන ලද රාජ්‍ය ප්‍රතිපත්ති නූතන රාජ්‍ය පාලනයේදි යොදාගත හැකි ආකාරය විග්‍රහකොට ඇත්නම් සමස්ත පිළිතුර දෙස බලා ලකුණු පිරිනමන්න. (ලකුණු 05යි)

07. 1. දුටු ගැමුණු රජතුමා
මෙතුමාගේ මූලික ජීවන තොරතුරු, ජාතික, ආගමික, ශාසනික, සාමාජික වශයෙන් සිදුකළ මෙහෙය ආදි තොරතුරු ඇතුළත් කොට පිළිතුර ගොඩනගා ඇත්නම් පිළිතුර දෙස බලා අදාළ ලකුණු පිරිනමන්න.
(10 ශ්‍රේණිය 37 - 39 පිටු) (ලකුණු 05යි)

2. මහින්දාගමනය
මහින්දාගමනයේ මූලික තොරතුරු ඇතුළත් විය යුතුයි. මෙරට බෞද්ධ සංස්කෘතියේ දියුණුව ඇතිවූ ආකාරය මහින්දාගමනයේ ලද දායාද ඔස්සේ විස්තර කර තිබිය යුතුය.
(11 ශ්‍රේණිය 118 - 122 පිටු) (ලකුණු 05යි)

3. දුක්ඛ සමුදය ආර්ය සත්‍යය.
මෙහි අර්ථය ලිවිය යුතුය. දුක හටගැනීමට හේතුවන තණ්හාව ගැන විස්තර කර තිබිය යුතුය.
(10 ශ්‍රේණිය 84 - 85 පිටු) (ලකුණු 05යි)

4. බුදු පිළිමවල දැකිය හැකි මුද්‍රා.
බුද්ධ ප්‍රතිමා කලාවේ අත් සහ ඇඟිලි උපයෝගී කරගෙන කරනු ලබන සන්නිවේදන ක්‍රියාවලිය මුද්‍රා ලෙස සැලකේ. එවැනි මුද්‍රා හයක් පිළිබඳව වාර්තාවල දැක්වේ.
ධයාන මුද්‍රාව, අභය මුද්‍රාව, විතර්ක මුද්‍රාව, ධර්ම චක්‍ර මුද්‍රාව, භූමිස්පර්ශ මුද්‍රාව, වරද මුද්‍රාව යන ඒවායේ අත් හා ඇඟිලි පිහිටා ඇති ආකාරයත් ඒවායෙන් දක්වන අර්ථයත් උදාහරණත් දක්වා තිබීම ප්‍රමාණවත්ය. පිළිතුර දෙස බලා ලකුණු පිරිනමන්න.
(11 ශ්‍රේණිය 128 - 130 පිටු) (ලකුණු 05යි)

* * * * *